58920

AL/2018/33/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.21/ 0830 - 1030

| | | | |
|---|---|---|---|
| ගිණුම්කරණය I<br>கணக்கீடு I<br>Accounting I | 33 S I | | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
* අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

විභාග අංකය : ...............................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අධි/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

**1.** ආයතනයක් විසින් පිළියෙල කරනු ලබන පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - මෙම ප්‍රකාශන ප්‍රධාන වශයෙන් ආයතනයක අතීත මූල්‍ය තොරතුරු සපයයි.
B - බාහිර පාර්ශ්වයන් ඉල්ලූ විටෙක මෙම ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.
C - ගිණුම්කරණ ප්‍රමිත සහ නෛතික අවශ්‍යතාවන්ට අනුකූලව මෙම ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (......)

tamilguru.lk

● **අංක 2, 3 සහ 4 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

නිහාල්ගේ ව්‍යාපාරයෙහි පහත ගනුදෙනු සිදු විය.

* 2018.03.01 - පිරිවැය රු. 150 000 ක් වූ භාණ්ඩ උපසේනගෙන් ණයට මිල දී ගැනීම
* 2018.03.05 - පිරිවැය රු. 30 000 ක් වූ භාණ්ඩ උපසේනට ආපසු යැවීම
* 2018.03.20 - පිරිවැය රු. 100 000 ක් වූ භාණ්ඩ රු. 160 000 කට ණයට විකිණීම
* 2018.03.20 - විකුණුම් කොමිස් රු. 10 000 ක් ගෙවීම
* 2018.04.02 - උපසේනට ගෙවිය යුතු සම්පූර්ණ මුදල පියවීම

**2.** 2018.03.31 දිනට නිහාල්ගේ ව්‍යාපාරයේ ඉහත ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** නිරූපණය කරන ගිණුම්කරණ සමීකරණය වනුයේ:

| | වත්කම් (රු.) | = | වගකීම් (රු.) | + | හිමිකම් (රු.) |
|---|---|---|---|---|---|
| (1) | +50 000 | | – | | +50 000 |
| (2) | +60 000 | | – | | +60 000 |
| (3) | +170 000 | | +120 000 | | +50 000 |
| (4) | +170 000 | | +150 000 | | +20 000 |
| (5) | +180 000 | | +120 000 | | +60 000 |

(......)

**3.** ඉහත ගනුදෙනු නිසා 2018.03.31 දිනට නිහාල්ගේ ව්‍යාපාරයේ ණයහිමි පාලන ගිණුමේ සහ ණයගැති පාලන ගිණුමේ ශේෂවල **වැඩි වීම** වනුයේ:

| | ණයහිමි පාලන ගිණුම (රු.) | ණයගැති පාලන ගිණුම (රු.) |
|---|---|---|
| (1) | 20 000 | 150 000 |
| (2) | 20 000 | 160 000 |
| (3) | 120 000 | 150 000 |
| (4) | 120 000 | 160 000 |
| (5) | 150 000 | 160 000 |

(......)

[දෙවැනි පිටුව බලන්න.

4. **උපසේන** සමග සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අනුපිළිවෙළට නිහාල්ගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීමට යොදාගනු ලබන මූලික ලියවිලි වනුයේ:
(1) ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය
(2) ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය
(3) ඉන්වොයිසිය, හරපත, ජර්නල් වවුචරය
(4) ඉන්වොයිසිය, බැරපත, ජර්නල් වවුචරය
(5) ඉන්වොයිසිය, ජර්නල් වවුචරය, ගෙවීම් වවුචරය (......)

More Past Papers at
tamilguru.lk

5. පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ පොදු ලෙජරය සම්බන්ධයෙන් **නිවැරදි** වන්නේ ද?
A - ආයතනයක ගනුදෙනු ප්‍රථමයෙන් පොදු ලෙජරයෙහි සටහන් කරනු ලබයි.
B - ආයතනයක් විසින් ද්විත්ව සටහන් ක්‍රමය මත පදනම්ව පවත්වාගෙන යනු ලබන ගිණුම් සමූහය පොදු ලෙජරය වේ.
C - ආයතනයක ගනුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කළ පසුව පොදු ලෙජරයට පිටපත් කරනු ලබයි.
D - ගිණුම් කාලච්ඡේදය අවසානයේදී ආයතනයක පොදු ලෙජරයෙහි සියලු ගිණුම් සඳහා පියවීමේ සටහන් තබනු ලැබේ.
(1) A පමණි. (2) B හා C පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

6. මූල්‍ය වර්ෂයක් තුළදී ව්‍යාපාරයක් විසින් උපයන ලද ලාභය නිරූපණය කරන සමීකරණය වනුයේ:
(1) වසර අග හිමිකම + ගැනිලි + නව ප්‍රාග්ධනය හඳුන්වාදීම – වසර මුල හිමිකම
(2) වසර අග හිමිකම + ගැනිලි – නව ප්‍රාග්ධනය හඳුන්වාදීම – වසර මුල හිමිකම
(3) වසර අග හිමිකම – ගැනිලි + නව ප්‍රාග්ධනය හඳුන්වාදීම – වසර මුල හිමිකම
(4) වසර අග හිමිකම – ගැනිලි – නව ප්‍රාග්ධනය හඳුන්වාදීම – වසර මුල හිමිකම
(5) වසර අග හිමිකම + ගැනිලි + නව ප්‍රාග්ධනය හඳුන්වාදීම + වසර මුල හිමිකම (......)

7. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළව ගිණුම්කරණ සංකල්ප භාවිත කිරීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?
A - මූල්‍ය ප්‍රකාශන තුළ හිමිකම වෙනම මූලිකාංගයක් ලෙස හඳුනාගැනීම සිදු කරනුයේ ඒකක සංකල්පයට අනුව ය.
B - මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සහ වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමට පදනම් වන්නේ අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.
C - එක් එක් කාලච්ඡේදයේ ක්ෂය, ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනීම ගැළපුම් සංකල්පයට අනුකූල වේ.
(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (......)

8. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මිනුම් කිරීම සඳහා යොදාගත හැක්කේ පහත කුමන මිනුම්කරණ පදනම් ද?
A - ඓතිහාසික පිරිවැය B - සාධාරණ අගය
C - උපලබ්ධි විය හැකි අගය D - වර්තමාන අගය
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

9. LKAS 17 (කල්බදු) ප්‍රමිතයට අනුව කල්බදු, මූල්‍ය සහ මෙහෙයුම් ලෙස වර්ග කිරීම මගින් **වඩාත්ම** ආරක්ෂා වන ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ගති ලක්ෂණය වන්නේ:
(1) සංසන්දනාත්මක බවයි. (2) විශ්වසනීය නියෝජනයයි.
(3) කාලීන බවයි. (4) අවබෝධ කරගත හැකි බවයි.
(5) සත්‍යාපනය කළ හැකි බවයි. (......)

10. පහත දැක්වෙන කුමක්, සුභසාධක සංගමයක් විසින් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සංරචක ලෙස සලකනු ලබන්නේ ද?
A - සමුච්චිත අරමුදල් ගිණුම B - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
C - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය D - සාමාජික මුදල් ගිණුම
E - ආදායම් සහ වියදම් ගිණුම
(1) A හා D පමණි. (2) B හා C පමණි. (3) A, D හා E පමණි.
(4) B, C හා E පමණි. (5) A, B හා E පමණි. (......)

[තුන්වැනි පිටුව බලන්න.

● **අංක 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ආයතනයක පොදු ලෙජරයෙහි 2018.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 500 000 ක් විය. කෙසේ වුව ද මෙම ශේෂය එදිනට ණයගැති ලෙජරයෙන් උපුටාගත් ශේෂවල එකතුවට සමාන නොවී ය. පසුව කරන ලද විමර්ශනයේදී පහත දැ හෙළිදරව් විය.

(i) 2018 මාර්තු මාසය තුළදී ණයගැතියන්ගෙන් ලද රු. 180 000 ක චෙක්පත් මුදල් ලැබීම් ජර්නලයේ සහ ණයගැති ලෙජරයෙහි අදාළ ගිණුම්වල පමණක් සටහන් කර තිබුණි. කෙසේ වුව ද මෙය පොදු ලෙජරයට පිටපත් කර නොමැත.

(ii) රු. 520 000 ක ණයට විකුණුම්, විකුණුම් ජර්නලයේ සටහන් කර තිබුණේ රු. 250 000 ක් ලෙස ය. කෙසේ වුව ද මෙය ණයගැති ලෙජරයෙහි නිවැරදිව සටහන් කර තිබුණි.

(iii) රු. 50 000 ක කපා හළ බොල්ණය පොදු ලෙජරයෙහි නිවැරදිව සටහන් කර තිබුණි. කෙසේ වුව ද මෙය ණයගැති ලෙජරයෙහි අදාළ ණයගැති ගිණුමේ සටහන් කර නොතිබුණි.

(iv) ණයගැති ලෙජරයෙන් ශේෂ උපුටා ගැනීමේදී රු. 80 000 ක ශේෂයක් මගහැරී තිබුණි.

**11.** ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති ලෙජරයෙන් උපුටා ගන්නා ලද ණයගැති ලෙජර ශේෂවල එකතුව වන්නේ:

(1) රු. 440 000 (2) රු. 470 000 (3) රු. 560 000
(4) රු. 590 000 (5) රු. 620 000 (......)

**12.** 2018.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ නිවැරදි ශේෂය වන්නේ:

(1) රු. 440 000 (2) රු. 470 000 (3) රු. 560 000
(4) රු. 590 000 (5) රු. 620 000 (......)

**13.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනයෙහි පහත තොරතුරු වාර්තා කර තිබුණි.

| විස්තරය | රු.'000 |
|---|---|
| විකුණුම් | 2 000 |
| ඉපැයූ පොලිය | 250 |
| මෝටර් රථ විකිණීමේ ලාභය | 150 |
| පොලී වියදම් | 300 |
| මෙහෙයුම් වියදම් | 500 |
| විකුණුම් පිරිවැය | 1 200 |
| ගැනිලි-භාණ්ඩ | 200 |

More Past Papers at
tamilguru.lk

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරය විසින් හඳුනාගත යුතු මුළු ආදායම සහ මුළු වියදම වනුයේ:

| | මුළු ආදායම (රු.'000) | මුළු වියදම (රු.'000) |
|---|---|---|
| (1) | 1 200 | 800 |
| (2) | 1 200 | 1 000 |
| (3) | 2 250 | 2 000 |
| (4) | 2 400 | 2 000 |
| (5) | 2 400 | 2 200 |

(......)

● **අංක 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පහත තොරතුරු නලින්ද සහ ශාන්ත හවුල් ව්‍යාපාරය හා බැඳේ.

| 2017.03.31 දිනට ශේෂ | නලින්ද (රු.'000) | ශාන්ත (රු.'000) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 800 | 500 |
| ජංගම ගිණුම් | 200 | 100 |

2017.04.01 දින නලින්ද රු. 200 000 ක් අතිරේක ප්‍රාග්ධනය ලෙස ද ශාන්ත රු. 500 000 ක් ණයක් ලෙස ද මුදලින් හවුල් ව්‍යාපාරයට ලබා දෙන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂික පොලී අනුපාතය 5% ක් වන අතර එය ශාන්තගේ ජංගම ගිණුමට බැර කරනු ලබයි.

නලින්ද සහ ශාන්ත අතර ලාභ සහ අලාභ පිළිවෙළින් 3:2 අනුපාතයට බෙදා ගනු ලබන අතර ඔවුන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල අවසාන ශේෂය මත 10% ක වාර්ෂික පොලී අනුපාතයකට හිමිකම් ලබයි.

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. 500 000 කි. වර්ෂය තුළදී නලින්ද සහ ශාන්ත පිළිවෙළින් රු. 100 000 ක සහ රු. 50 000 ක මුදල්, හවුල් ව්‍යාපාරයෙන් ගැනිලි ලෙස ලබා ගන්නා ලදී. මේ හැර වෙනත් කිසිදු මුදලක් හවුල්කරුවන් විසින් ලබාගෙන නොමැත.

[ඉතිරිවැනි පිටුව බලන්න.

**14.** 2018.03.31 දිනට මෙම හවුල් ව්‍යාපාරයේ හිමිකම:

(1) රු. 1 350 000 (2) රු. 1 500 000 (3) රු. 1 650 000
(4) රු. 2 175 000 (5) රු. 2 300 000 (……)

**15.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී හවුල්කරුවන් සමග සිදු වූ ගනුදෙනු තුළින් ලද ශුද්ධ මුදල සහ 2018.03.31 දිනට ශාන්තගේ ජංගම ගිණුමේ ශේෂය:

| | ලද ශුද්ධ මුදල (රු.) | ශාන්තගේ ජංගම ගිණුමේ ශේෂය (රු.) |
|---|---|---|
| (1) | 50 000 | 265 000 |
| (2) | 50 000 | 410 000 |
| (3) | 550 000 | 265 000 |
| (4) | 550 000 | 315 000 |
| (5) | 550 000 | 410 000 |

(……)

**16.** එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වූ සමාගමක් මිල දී ගත් යන්ත්‍රයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| දිනය | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|
| 2017.04.01 | යන්ත්‍රය ආනයනය කිරීම (15% ක VAT සහිතව) | 575 000 |
| 2017.04.15 | සමාගම වෙත යන්ත්‍රය ප්‍රවාහනය කිරීම | 40 000 |
| 2017.04.30 | වැඩබිම සකස් කිරීම සහ යන්ත්‍රය සවි කිරීම | 60 000 |
| 2017.05.15 | මූලික පරීක්ෂණ ධාවනය සිදු කිරීම සහ එමගින් යන්ත්‍රය හොඳින් ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනීම | 80 000 |
| 2017.05.15 | මූලික පරීක්ෂණ ධාවනයේදී නිපදවූ අයිතම විකිණීමෙන් මුදල් ලැබීම | 30 000 |
| 2017.06.30 | විවෘත කිරීමේ උත්සවය පැවැත්වීම | 20 000 |

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව හඳුනා ගැනීමේදී මෙම යන්ත්‍රයෙහි පිරිවැය සහ යන්ත්‍ර ක්ෂය කිරීම ආරම්භ කරන දිනය වන්නේ:

| | පිරිවැය (රු.) | දිනය |
|---|---|---|
| (1) | 540 000 | 2017.04.15 |
| (2) | 650 000 | 2017.05.15 |
| (3) | 650 000 | 2017.06.30 |
| (4) | 725 000 | 2017.06.30 |
| (5) | 755 000 | 2017.05.15 |

(……)

**17.** සීමිත ගමගේ පොදු සමාගම 2017.04.01 දින මූල්‍ය කල්බද්දක් මත මෝටර් රථයක් මිල දී ගන්නා ලදී. මෙදිනට මෝටර් රථයේ සාධාරණ අගය රු. 5 400 000 ක් වූ අතර එදිනම රු. 1 400 000 ක මූලික ගෙවීමක් සිදු කරන ලදී. වසර 4 ක කල්බදු කාල සීමාව තුළදී රු. 1 262 000 ක කල්බදු වාරිකයක් සෑම වසරකම මාර්තු 31 දින ගෙවිය යුතු ය. පළමු වාරිකය 2018.03.31 දින ගෙවන ලදී. කල්බද්ද සඳහා ගම්‍ය පොලී අනුපාතය වාර්ෂිකව 10% කි.

LKAS 17 (කල්බදු) ප්‍රමිතයට අනුව 2018.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් සහ ජංගම නොවන වගකීම් ලෙස දක්වනු ලබන කල්බදු වගකීම් වන්නේ:

| | ජංගම වගකීම් (රු.) | ජංගම නොවන වගකීම් (රු.) |
|---|---|---|
| (1) | 862 000 | 2 189 800 |
| (2) | 862 000 | 3 138 000 |
| (3) | 948 200 | 2 189 800 |
| (4) | 948 200 | 3 138 000 |
| (5) | 1 262 000 | 1 876 000 |

(……)

[ පස්වැනි පිටුව බලන්න.

● අංක 18 සහ 19 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

පහත තොරතුරු සීමිත අජිත් පොදු සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු. |
|---|---|
| පිරිවැටුම | 800 000 |
| විකුණුම් පිරිවැය | 300 000 |
| පරිපාලන හා බෙදාහැරීමේ වියදම් | 80 000 |
| ප්‍රත්‍යාගණනය මත අතිරික්තය/(හිඟය): | |
| ඉඩම් | 60 000 |
| යන්ත්‍ර | 100 000 |
| කාර්යාල උපකරණ | (75 000) |

සියලු ම දේපළ, පිරියත සහ උපකරණ 2018.03.31 දින ප්‍රත්‍යාගණනය කරන ලදී. ඉඩම් ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනය කළ අතර යන්ත්‍ර සහ කාර්යාල උපකරණ දෙවන වතාවට ප්‍රත්‍යාගණනය කරන ලදී. යන්ත්‍ර සහ කාර්යාල උපකරණ 2016.03.31 දින ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනය කිරීමෙන් පිළිවෙළින් රු. 30 000 ක හිඟයක් සහ රු. 40 000 ක අතිරික්තයක් ඇති විය. සමාගමේ සියලුම වත්කම්, හිමිකම මගින් මූල්‍යනය කර ඇති අතර සමාගම ආදායම් බදු සඳහා යටත් නොවේ.

**18.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ මුළු ආදායම සහ මුළු විස්තීරණ ආදායම:

| | මුළු ආදායම (රු.) | මුළු විස්තීරණ ආදායම (රු.) |
|---|---|---|
| (1) | 900 000 | 160 000 |
| (2) | 930 000 | 505 000 |
| (3) | 960 000 | 505 000 |
| (4) | 960 000 | 580 000 |
| (5) | 1 000 000 | 160 000 |

(......)

**19.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම:

| | ලාභය (රු.) | වෙනත් විස්තීරණ ආදායම (රු.) |
|---|---|---|
| (1) | 345 000 | 90 000 |
| (2) | 345 000 | 130 000 |
| (3) | 385 000 | 160 000 |
| (4) | 415 000 | 90 000 |
| (5) | 415 000 | 130 000 |

More Past Papers at
tamilguru.lk

(......)

**20.** සීමිත සාරංග පොදු සමාගම ඇඟළුම් අලෙවි කිරීමේ නිරත වේ. මෙම සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සාරාංශගත මුදල් ගිණුම පහත දැක්වේ.

**මුදල් ගිණුම (රු.)**

| | | | |
|---|---|---|---|
| ශේෂය - 2017.04.01 | 70 000 | ණයහිමි පාලන | 720 000 |
| විකුණුම් | 850 000 | ගෙවිය යුතු කුලී වියදම් | 40 000 |
| ණයගැති පාලන | 550 000 | බෙදාහැරීමේ වියදම් | 180 000 |
| ලාභාංශ ආදායම් | 10 000 | පරිපාලන වියදම් | 270 000 |
| බැංකු ණය | 500 000 | මෝටර් රථයක් මිලට ගැනුම් | 560 000 |
| | | ආදායම් බදු | 125 000 |
| | | ශේෂය-2018.03.31 | 85 000 |
| | **1 980 000** | | **1 980 000** |

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය:

(1) රු. 65 000 (2) රු. 75 000 (3) රු. 85 000
(4) රු. 115 000 (5) රු. 190 000 (......)

**21.** 2017.03.31 දිනට සීමිත නිමාලි පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් පහත ශේෂ උපුටා ගන්නා ලදී.

| **විස්තරය** | **රු.** |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - එකක් රු. 10 බැගින් නිකුත් කළ සාමාන්‍ය කොටස් 80 000 | 800 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 300 000 |
| රඳවාගත් ඉපැයුම් | 450 000 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ සමාගම විසින් කරන ලද කොටස් නිකුතුවල තොරතුරු පහත පරිදි වේ.

| **දිනය** | **විස්තරය** |
|---|---|
| 2017.05.01 | කොටසක් රු. 15 බැගින් කොටස් 20 000 ක ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් කරන ලදී. කොටස් 25 000 ක් සඳහා අයදුම්පත් ලැබුණි. කොටස් සමානුපාතිකව විභජනය කරන ලදී. |
| 2018.01.01 | 2017.04.01 දිනට පැවති සෑම කොටස් හතරකටම එක බැගින් කොටසක් රු. 20 බැගින් නිකුත් කරමින් රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීත කරන ලදී. |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු. 600 000 ක් විය.

2018.03.31 දිනට මෙම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය-සාමාන්‍ය කොටස් සහ හිමිකම:

| | **ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් (රු.)** | **හිමිකම (රු.)** |
|---|---|---|
| (1) | 1 100 000 | 1 850 000 |
| (2) | 1 100 000 | 2 525 000 |
| (3) | 1 500 000 | 2 450 000 |
| (4) | 1 500 000 | 2 850 000 |
| (5) | 1 600 000 | 2 925 000 |

(……)

**22.** සීමිත අන්ජුල පොදු සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂවරුන් විසින් 2018.05.15 දින අනුමත කළ අතර සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2018.05.30 දින පවත්වන ලදී. 2018.03.31 දිනට පසුව පහත සිදුවීම් සමාගමේ සිදු විය.

A - පිරිවැය රු. 1 000 000 ක් වූ ගොඩනැගිල්ලක් 2018.04.10 දින ඇති වූ ගින්නකින් විනාශ විය.

B - රු. 500 000 ක් ගෙවිය යුතුව තිබූ ණයගැතියකු 2018.05.05 දින බුන්වත් වූ බව ප්‍රකාශ කරන ලදී. 2018.04.05 දින සිදු කරන ලද භාණ්ඩ විකිණීමක් නිසා මෙම ණයගැති ශේෂය ඇති විය.

C - 2018.03.31 දින ආනයනය කරන ලද මෝටර් රථ සඳහා ගෙවිය යුතු රු. 400 000 ක බදු ඇස්තමේන්තුව ශ්‍රී ලංකා රේගුව විසින් 2018.05.10 දින සමාගමට දැනුම් දෙන ලදී.

LKAS 10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත කුමන සිදුවීම/සිදුවීම් ගළපන සිද්ධීන් ලෙස සලකනු ලබයි ද?

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) B හා C පමණි. (……)

**23.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සමන් පොදු සමාගමට පහත තොරතුරු අදාළ වේ.

| | **රු.'000** |
|---|---|
| විකුණුම් (සියලු විකුණුම් ණය පදනම මත වේ.) | 2 400 |
| දළ ලාභය | 1 400 |
| සාමාන්‍ය තොගය | 200 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය එකතු කිරීමේ කාලය දින 45 කි. වසරකට දින 360 ක් බව උපකල්පනය කරන්න.

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ තොග රැඳවුම් කාලය සහ සාමාන්‍ය ණයගැතියෝ:

| | **තොග රැඳවුම් කාලය (දින)** | **සාමාන්‍ය ණයගැතියෝ (රු.)** |
|---|---|---|
| (1) | 30 | 53 333 |
| (2) | 30 | 125 000 |
| (3) | 30 | 300 000 |
| (4) | 72 | 53 333 |
| (5) | 72 | 300 000 |

(……)

**24.** සමාගමක ගිණුම්කරණ අනුපාත සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය **අසත්‍ය** වේ ද?
(පහත එක් එක් අවස්ථාවට බලපාන අනෙකුත් සාධක ස්ථාවරව පවතී යයි උපකල්පනය කරන්න.)
(1) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු අනුපාතය වැඩි වීමක් පොලී ආවරණ අනුපාතයට බලපෑමක් ඇති නොකෙරේ.
(2) පසුගිය වසරට සාපේක්ෂව ණයගැති පිරිවැටුම් අනුපාතය වැඩි වීමක් මගින් ප්‍රවර්තන වර්ෂය තුළදී එලදායී ණය එකතු කිරීමේ උපක්‍රමයක් අනුගමනය කළ බව පෙන්නුම් කෙරේ.
(3) පසුගිය වසරට සාපේක්ෂව තොග රැඳවුම් කාලයේ වැඩි වීමක් මගින් ප්‍රවර්තන වර්ෂය තුළදී එලදායී තොග කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කළ බව පෙන්නුම් කෙරේ.
(4) පසුගිය වසරට සාපේක්ෂව මුදල් හා මුදල් සමාන දෑවල වැඩි වීමක් මගින් ප්‍රවර්තන වර්ෂයේ ද්‍රවශීලතා අනුපාතවල වැඩි වීමක් පෙන්නුම් කෙරේ.
(5) පසුගිය වසරට සාපේක්ෂව අවසාන තොගයේ වැඩි වීමක් මගින් ප්‍රවර්තන වර්ෂයේ ක්ෂණික වත්කම් අනුපාතයට බලපෑමක් ඇති නොකෙරේ. (……)

**25.** කළමනාකරණ ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?
A - එය කළමනාකරණයේ අභිමතය පරිදි සිදු කරනු ලබයි.
B - එය සියළු ඇල්මැති පාර්ශ්වයන්ගේ අවශ්‍යතා ගැන අවධානය යොමු කරයි.
C - එය අනාගත කටයුතු සැලසුම් කිරීමට භාවිත කරනු ලබයි.
D - එය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම මත පිහිටා තොරතුරු සපයනු ලබයි.
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (……)

**26.** සමාගමක් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා සුවිශේෂී අමුද්‍රව්‍යයක් භාවිත කරයි.
එහි යළි ඇණවුම් ප්‍රමාණය ඒකක 8 000 ක් වේ. අමුද්‍රව්‍ය භාවිතය සහ පොරොත්තු කාලය පහත පරිදි වේ.

| | උපරිම | අවම |
|---|---|---|
| දිනක භාවිතය (ඒකක) | 200 | 100 |
| පොරොත්තු කාලය (සති) | 05 | 03 |

සමාගම සතියේ දින හතම වැඩ කරනු ලබයි. මෙම සමාගම විසින් පවත්වා ගනු ලබන අවම සහ උපරිම තොග මට්ටම් වනුයේ:

| | අවම තොග මට්ටම (ඒකක) | උපරිම තොග මට්ටම (ඒකක) |
|---|---|---|
| (1) | 2 800 | 10 800 |
| (2) | 2 800 | 12 900 |
| (3) | 3 800 | 12 900 |
| (4) | 6 000 | 10 800 |
| (5) | 6 000 | 12 900 |

(……)

**27.** නිෂ්පාදන සමාගමක නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් ඇත. මෙම දෙපාර්තමේන්තුවලට අදාළ අයවැයගත සහ සත්‍ය තොරතුරු පහත පරිදි වේ.

| | නිෂ්පාදන දෙපාර්තමේන්තු | | සේවා දෙපාර්තමේන්තුව |
|---|---|---|---|
| | යන්ත්‍ර | එකලස් | ගබඩාව |
| අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (රු.) | 420 000 | 320 000 | 180 000 |
| අයවැයගත සෘජු අමුද්‍රව්‍ය පිරිවැය (රු.) | 500 000 | 400 000 | – |
| අයවැයගත යන්ත්‍ර පැය | 52 000 | 2 000 | – |
| අයවැයගත ශ්‍රම පැය | 10 000 | 20 000 | – |
| සත්‍ය යන්ත්‍ර පැය | 50 000 | 1 000 | – |
| සත්‍ය ශ්‍රම පැය | 13 000 | 16 000 | – |

සෘජු අමුද්‍රව්‍ය පිරිවැය මත සේවා දෙපාර්තමේන්තුවේ පොදුකාර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර නැවත විභජනය කරනු ලැබේ.
යන්ත්‍ර දෙපාර්තමේන්තුවට සහ එකලස් දෙපාර්තමේන්තුවට වඩාත්ම උචිත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත:

| | යන්ත්‍ර දෙපාර්තමේන්තුව | එකලස් දෙපාර්තමේන්තුව |
|---|---|---|
| (1) | යන්ත්‍ර පැයකට රු. 10 | ශ්‍රම පැයකට රු. 20 |
| (2) | යන්ත්‍ර පැයකට රු. 10 | යන්ත්‍ර පැයකට රු. 200 |
| (3) | යන්ත්‍ර පැයකට රු. 10 | ශ්‍රම පැයකට රු. 25 |
| (4) | ශ්‍රම පැයකට රු. 40 | ශ්‍රම පැයකට රු. 25 |
| (5) | ශ්‍රම පැයකට රු. 52 | යන්ත්‍ර පැයකට රු. 200 |

(……)

- **අංක 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් තනි භාණ්ඩයක් නිපදවනු ලබන අතර ඒකකයක් රු. 50 කට විකුණනු ලබයි. පහත තොරතුරු ක්‍රියාකාරී මට්ටම් දෙකකට අදාළ වේ.

| **නිෂ්පාදිත ඒකක ගණන** | **ඒකකයක පිරිවැය (රු.)** |
| --- | --- |
| 2 000 | 50 |
| 3 000 | 40 |

More Past Papers at
tamilguru.lk

**28.** මුළු ස්ථාවර පිරිවැය සහ ඒකක විචල්‍ය පිරිවැය පිළිවෙළින්:
(1) රු. 20 000 සහ රු. 10
(2) රු. 20 000 සහ රු. 20
(3) රු. 40 000 සහ රු. 30
(4) රු. 60 000 සහ රු. 10
(5) රු. 60 000 සහ රු. 20
(......)

**29.** සමච්ඡේදන ලක්ෂ්‍ය (ඒකකවලින්) සහ දායක විකුණුම් අනුපාතය පිළිවෙළින්:
(1) 500 සහ 0.4
(2) 667 සහ 0.4
(3) 1 000 සහ 0.8
(4) 1 500 සහ 0.6
(5) 2 000 සහ 0.6
(......)

**30.** ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති ඇගයීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?
A - පිළිගෙවුම් කාල ක්‍රමය, මුදලේ කාලීන වටිනාකම සැලකිල්ලට නොගනී.
B - ශුද්ධ වර්තමාන වටිනාකම් ක්‍රමය, මුළු ව්‍යාපෘති කාලය පුරා ලද මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගනී.
C - ගිණුම්කරණ ඉපැයුම් අනුපාතය මුළු ව්‍යාපෘති කාලය සඳහා ආදායම් සහ වියදම් සැලකිල්ලට ගනී.
(1) A පමණි.
(2) B පමණි.
(3) A හා C පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C යන සියල්ලම.
(......)

ලකුණු ........ × ........ = ..........

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

**31.** පහත දී ඇති එක් එක් තොරතුරු කෙරෙහි **වඩාත්ම** උනන්දුවක් දක්වන්නේ ව්‍යාපාරයක පහත සඳහන් කුමන ඇල්මැති පාර්ශ්වය ද?
(1) රජය (2) ආයෝජකයන් (3) ණය සැපයුම්කරුවන් (4) කළමනාකරුවන්

| **තොරතුරු** | **ඇල්මැති පාර්ශ්වය (අංකය දක්වන්න)** |
| --- | --- |
| A - දිගුකාලීන බැඳීම් පියවීමට ආයතනය සතු හැකියාව | :...................... |
| B - ආයෝජිත ප්‍රාග්ධනයට සාපේක්ෂව ආයතනයේ ලාභදායීත්වය | :...................... |
| C - ආයතනයක් නිපදවනු ලබන භාණ්ඩවල පිරිවැය | :...................... |
| D - ආයතනය ගෙවනු ලබන බදු ප්‍රමාණය | :...................... |

- **අංක 32, 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2018 මාර්තු මාසයේදී සීමිත ගැමුණු පොදු සමාගමේ පහත ගනුදෙනු සිදු විය. මෙම සමාගමේ ගිණුම් වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ.

(1) සාමාන්‍ය කොටස් නිකුත් කිරීමෙන් රු. 500 000 ක මුදල් ලැබුණි.
(2) රු. 1 000 000 ක භාණ්ඩ ණයට මිල දී ගැනීම.
(3) ඉඩම ප්‍රථමවතාවට ප්‍රත්‍යාගණනය කරන ලද අතර එමගින් රු. 300 000 ක ඌනතාවක් ඇති විය.
(4) රු. 60 000 ක ප්‍රචාරණ වියදම් දරන ලද අතර එය 2018 මැයි මාසයේදී ගෙවිය යුතු ය.

**32.** පහත කුමන ප්‍රකාශය මගින් ඉහත එක් එක් ගනුදෙනුවේ බලපෑම දක්වනු ලබයි ද?

| **බලපෑම** | **ගනුදෙනුව (අංකය දක්වන්න)** |
| --- | --- |
| A - වත්කම් අඩු වීම සහ හිමිකම අඩු වීම | :.............................. |
| B - වගකීම් වැඩි වීම සහ හිමිකම අඩු වීම | :.............................. |
| C - වත්කම් වැඩි වීම සහ හිමිකම වැඩි වීම | :.............................. |
| D - වත්කම් වැඩි වීම සහ වගකීම් වැඩි වීම | :.............................. |

**33.** ඉහත එක් එක් ගනුදෙනුව වාර්තා කරනු ලබන මූලික සටහන් පොත සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලික සටහන් පොත |
|---|---|
| (1) | ........................................................ |
| (2) | ........................................................ |
| (3) | ........................................................ |
| (4) | ........................................................ |

**34.** ඉහත ගනුදෙනු පොදු ලෙජරයේ වාර්තා කරනුයේ කුමන ගිණුම් වර්ගයක් යටතේ ද යන්න '√' ලකුණක් යොදමින් දක්වන්න.

| ගනුදෙනුව | ගිණුම් වර්ගය | | | | |
|---|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | හිමිකම් | ආදායම් | වියදම් |
| (1) | ............ | ............ | ............ | ............ | ............ |
| (2) | ............ | ............ | ............ | ............ | ............ |
| (3) | ............ | ............ | ............ | ............ | ............ |
| (4) | ............ | ............ | ............ | ............ | ............ |

● **අංක 35 සහ 36 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පහත තොරතුරු සීමිත අමල් පොදු සමාගමේ 2017.04.01 දිනට අදාළ වේ.

| | රු.' 000 |
|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 900 |
| අඩමාණ ණය සඳහා ඉඩ හැරීම | 90 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ පහත ගනුදෙනු සිදු කරන ලදී.

| | රු.' 000 |
|---|---|
| ණයට විකුණුම් | 3 600 |
| ආපසු එවුම් | 400 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා මුදල් ලැබීම | 2 800 |
| කපාහරින ලද බොල් ණය | 200 |

ව්‍යාපාරය විසින් වසර අවසාන වෙළෙඳ ලැබිය යුතු දෑ මත 10% ක අඩමාණ ණය සඳහා ඉඩ හැරීමක් සිදු කරනු ලබයි.

**35.** 2018.03.31 දිනට පහත දෑ:

(අ) වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂය (රු.' 000) ....................

(ආ) වාර්තා කරන ලද වෙළෙඳ ලැබිය යුතු දෑවල ධාරණ වටිනාකම (රු.' 000) ....................

**36.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බොල් ණය සහ අඩමාණ ණය වාර්තා කිරීමට අදාළ ජර්නල් සටහන්:

| | විස්තරය | හර (රු.' 000) | බැර (රු.' 000) |
|---|---|---|---|
| (අ) | ................................................ | ..................... | |
| | ................................................ | | ..................... |
| | (බොල් ණය වාර්තා කිරීම) | | |
| (ආ) | ................................................ | ..................... | |
| | ................................................ | | ..................... |
| | (අඩමාණ ණය වාර්තා කිරීම) | | |

**37.** ඉසුරුගේ ආහාර සැපයීමේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදු විය.

* 2018.01.15 - ආහාර සැපයීමට ඇණවුමක් භාරගත් අතර රු. 100 000 ක මුදල් අත්තිකාරමක් ලැබුණි.
* 2018.01.28 - ඉහත ඇණවුම සඳහා ආහාර සැපයූ අතර රු. 200 000 ක මුදල් ලැබුණි.
* 2018.02.05 - මෙම ඇණවුම සඳහා ඉතිරි මුදල් රු. 50 000 ක් ලැබුණි.

ඉහත ඇණවුමේ ආදායම හඳුනා ගැනීමට අදාළව:

(අ) ආදායම හඳුනා ගන්නා දිනය :................................

(ආ) මෙදිනට හඳුනා ගත යුතු ආදායම : රු. ............................

(ඉ) වඩාත්ම උචිත ගිණුම්කරණ සංකල්පය :................................

[දහවැනි පිටුව බලන්න.

**38.** සීමිත පොදු සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත සඳහන් අයිතම ගැළපීමෙන් එහි ලාභය **වැඩිවේ ද (I), අඩුවේ ද (D)** හෝ **වෙනස් නොවේ ද (NC)** යන්න දක්වන්න. (මෙම අයිතම මෙතෙක් පොත්වල ගැළපුම් කර නොමැත.)

| | **ලාභයට වන බලපෑම (I, D හෝ NC ලෙස දක්වන්න.)** |
|---|---|
| A - උපචිත විදුලිය | :........................... |
| B - ලැබිය යුතු පොලී ආදායම | :........................... |
| C - ණයහිමියන්ගෙන් ලද වට්ටම් | :........................... |
| D - ඉඩමක් ප්‍රථමවරට ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය | :........................... |

**39.** රන්තරු ක්‍රීඩා සමාජයෙහි සාමාජිකයින් ගණන 100 කි. සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 2 400 කි. පහත තොරතුරු දී ඇත.

| **විස්තරය** | **2018.03.31 දිනට (රු.)** | **2017.03.31 දිනට (රු.)** |
|---|---|---|
| කලින් ලද සාමාජික මුදල් | 24 000 | 12 000 |
| හිඟ සාමාජික මුදල් | 36 000 | 48 000 |

මෙම ක්‍රීඩා සමාජයේ පහත දෑ දක්වන්න:

(අ) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් ආදායම රු. ....................

(ආ) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ලද මුළු සාමාජික මුදල රු. ....................

**40.** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අනුර සහ බිමල් හවුල් ව්‍යාපාරයේ ලාභ සහ අලාභ විසර්ජන ගිණුමෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු. | රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය මත පොලිය 5%: | | |
| අනුර | 5 000 | |
| බිමල් | 20 000 | 25 000 |
| ලාභ කොටස්: | | |
| අනුර | 20 000 | |
| බිමල් | 10 000 | 30 000 |

මෙම ගිණුම ආධුනික ගිණුම් ලිපිකරුවකු විසින් පිළියෙල කර ඇති අතර එහිදී හවුල් ව්‍යාපාර ගිවිසුම සැලකිල්ලට ගෙන නොමැත. කෙසේ වුව ද මෙම වටිනාකම් හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වලට පිටපත් කර ඇත.

හවුල් ව්‍යාපාර ගිවිසුම අනුව අනුර සහ බිමල් අතර ලාභ සහ අලාභ පිළිවෙළින් 3:2 අනුපාතයට බෙදාගත යුතු වේ. ගිවිසුමෙහි ප්‍රාග්ධනය මත පොලී සම්බන්ධයෙන් කිසිදු වගන්තියක් නොමැත.

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ශේෂ නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන ලියා දක්වන්න.

| **විස්තරය** | **හර (රු.)** | **බැර (රු.)** |
|---|---|---|
| ........................................... | ............... | |
| ........................................... | | ............... |

**41.** ශාන්ත සහ යසිත් ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති. ඔවුන් පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනු ලැබේ. 2017.04.01 දින දයාන් හවුල්කරුවෙකු ලෙස බඳවා ගත් අතර එදිනට ශාන්තගේ සහ යසිත්ගේ ප්‍රාග්ධන ශේෂ පිළිවෙළින් රු. 1 000 000 ක් සහ රු. 750 000 ක් විය. ශාන්ත, යසිත් සහ දයාන් අතර නව ලාභාලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙළින් 2:2:1ක් විය. මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 3 000 000 ක් ලෙසට ඇස්තමේන්තු කරන ලදී. තව ද කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනීමටත් එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැළපීමටත් තීරණය කරන ලදී.

කීර්තිනාමය ගැළපූ පසු ශාන්තගේ සහ යසිත්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ දක්වන්න.

(අ) ශාන්ත රු. ....................................   (ආ) යසිත් රු. ......................................

**42.** පහත සඳහන් ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **T/F** |
|---|---|
| A - කාලය සහ වටිනාකම අවිනිශ්චිත වූ 'විය හැකි බැඳීම්' ප්‍රතිපාදනය වේ. | :................ |
| B - අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල හෙළිදරව් කරනු ලැබේ. | :................ |
| C - පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට වසර අවසාන තොගය ආගණනය කරයි. | :................ |
| D - ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සඳහා අතීතයට බලපාන පරිදි ගිණුම් තබනු ලැබේ. | :................ |

**43.** LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව පහත අයිතම මූල්‍ය ප්‍රකාශනවල කුමන සංරචකයේ ඉදිරිපත් කරන්නේ ද යන්න සඳහන් කරන්න.

| **අයිතමය** | **මූල්‍ය ප්‍රකාශන සංරචකය** |
|---|---|
| A - විකුණුම් පිරිවැය | .................................................................... |
| B - රඳවාගත් ඉපැයුම් | .................................................................... |
| C - ගෙවූ ආදායම් බදු | .................................................................... |
| D - වෙළෙඳ ගෙවිය යුතු දෑ | .................................................................... |

**44.** LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතය අනුව ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ගලායාම් ලෙස සටහන් කරන අයිතම **දෙක** බැගින් සඳහන් කරන්න.

| **වර්ගීකරණය** | **අයිතමය** |
|---|---|
| (අ) ආයෝජන ක්‍රියාකාරකම් | 1. .................................................................... |
| | 2. .................................................................... |
| (ආ) මූල්‍ය ක්‍රියාකාරකම් | 1. .................................................................... |
| | 2. .................................................................... |

**45.** සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක තොග පිරිවැටුම් අනුපාතය සහ ජංගම අනුපාතය පිළිවෙළින් වාර 10 ක් සහ 2:1 ක් විය. නමුත් පහත ගනුදෙනු පොත්වලින් අත්හැරී ඇති බව පසුව දැන ගන්නා ලදී.

මෙම ගනුදෙනු සැලකිල්ලට ගත් විට තොග පිරිවැටුම් සහ ජංගම අනුපාත **වැඩිවේ ද** (I), **අඩුවේ ද** (D) හෝ **වෙනස් නොවේ ද** (NC) යන්න සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **තොග පිරිවැටුම් අනුපාතය (I/D/NC)** | **ජංගම අනුපාතය (I/D/NC)** |
|---|---|---|
| (අ) පිරිවැය රු. 500 000 ක් වූ භාණ්ඩ රු. 800 000 කට ණයට විකිණීම | ................ | ................ |
| (ආ) පිරිවැය රු. 250 000 ක් වූ භාණ්ඩ ණයට මිල දී ගැනීම | ................ | ................ |

**46.** පහත සඳහන් තොරතුරු සීමිත ආනන්ද පොදු සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| | **රු.' 000** |
|---|---|
| දළ ලාභය | 4 800 |
| විකුණුම් පිරිවැය | 7 200 |
| වෙනත් ආදායම් | 1 500 |
| මෙහෙයුම් සහ මූල්‍ය වියදම් | 4 500 |
| වෙනත් විස්තීරණ ආදායම් | 1 500 |

සමාගමේ ආදායම් බදු අනුපාතය බදු පෙර ලාභයෙන් 20% ක් වේ.

මෙම සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත දක්වන්න.

(අ) දළ ලාභ අනුපාතය (%) :......................

(ආ) ශුද්ධ ලාභ අනුපාතය (%) :......................

**47.** සමාගමක් සෙල්ලම් බඩු වර්ගයක් නිපදවීමට සැලසුම් කරයි. දී ඇති කාලච්ඡේදයක් සඳහා මෙම නිෂ්පාදිතයට අදාළ අයවැය තොරතුරු පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| ඒකකයක සෘජු ද්‍රව්‍ය පිරිවැය | | රු. | 2 300 |
| ඒකකයක සෘජු ශ්‍රම පිරිවැය | | රු. | 1 000 |
| ඒකකයක මුළු සෘජු පිරිවැය | | රු. | 3 300 |
| සෘජු ශ්‍රම ඊට්ටය | පැයකට | රු. | 200 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය | සෘජු ශ්‍රම පැයකට | රු. | 300 |
| නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | මුළු පිරිවැයෙන් | | 20% |

පහත දෑ දක්වන්න:

(අ) ඒකකයක අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. :.........................

(ආ) ඒකකයක අයවැයගත නිෂ්පාදන පිරිවැය රු. :.........................

(ඉ) ඒකකයක අයවැයගත මුළු පොදුකාර්ය පිරිවැය රු. :.........................

**48.** සමාගමක් 'බීටා' නම් වූ තනි භාණ්ඩයක් නිපදවනු ලබයි. පහත තොරතුරු එහි නිෂ්පාදනය සඳහා භාවිත කරන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍යයෙහි වාර්ෂික පරිභෝජනය | ඒකක | 10 000 |
| ඇණවුම් පිරිවැය | ඇණවුමකට රු. | 400 |
| රඳවා ගැනීමේ පිරිවැය | ඒකකයකට රු. | 200 |

More Past Papers at
tamilguru.lk

පහත දෑ දක්වන්න:

(අ) මෙම අමුද්‍රව්‍යයේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ...................................

(ආ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය මත පදනම්ව වසරකට කළ යුතු ඇණවුම් සංඛ්‍යාව .......................

**49.** සමාගමක් විසින් තනි භාණ්ඩයක් නිපදවනු ලබන අතර එම ඒකකයක් රු. 60 කට විකුණනු ලබයි. සමාගම ඒකක 16 000 ක් විකුණන්නේ නම් ඒකකයක අලාභය රු. 10 ක් වන අතර ඒකක 40 000 ක් විකුණන්නේ නම් ඒකකයක ලාභය රු. 8 කි.

පහත දෑ දක්වන්න:

(අ) මුළු ස්ථාවර පිරිවැය රු. :.........................

(ආ) ඒකක දායකය රු. :.........................

(ඉ) සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකක :.........................

**50.** සේවක කාර්යසාධනය දියුණු කිරීම සඳහා සමාගමක් එහි කර්මාන්තශාලාව වායුසමීකරණය කිරීමට තීරණය කරන ලදී. වායුසමීකරණයේ පිරිවැය රු. 1 500 000 ක් වේ. එහි ඵලදායී ජීව කාලය වසර 5 ක් වන අතර සුන්බුන් අගයක් නොමැත. සේවක කාර්යසාධනය වැඩි වීම නිසා වාර්ෂික ආදායම රු. 600 000 කින් වැඩි වේ යැයි ඇස්තමේන්තු කර ඇත. තව ද වායුසමීකරණය සඳහා රු. 240 000 ක අතිරේක නඩත්තු වියදමක් වාර්ෂිකව දැරීමට සිදු වේ. සමාගම එහි දේපළ, පිරියත සහ උපකරණ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

මෙම යෝජිත ව්‍යාපෘතියට අදාළව පහත දෑ දක්වන්න.

(අ) පළමු වර්ෂයේ ඇස්තමේන්තුගත ශුද්ධ මුදල් ප්‍රවාහය රු. :.........................

(ආ) අපේක්ෂිත වාර්ෂික ශුද්ධ ලාභය රු. :.........................

ලකුණු

* * *

58920

AL/2018/33/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

**33 S II**

2018.08.27 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

※ **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.

※ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

1. සීමිත හිරුක පොදු සමාගම සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක නිරත වේ. 2018.03.31 දිනට එහි ශේෂ පිරික්සුම පහත දී ඇත.

| **විස්තරය** | **හර (රු. '000)** | **බැර (රු. '000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 65 500 | |
| ගැනුම් | 41 850 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 22 600 | |
| 2017.04.01 දිනට තොගය | 9 750 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 250 | |
| පරිපාලන වියදම් | 7 100 | |
| බෙදාහැරීමේ පිරිවැය | 9 850 | |
| ගෙවූ ආදායම් බදු | 1 100 | |
| විකුණුම් | | 83 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 12 500 |
| 2017.04.01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | | 670 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 35 000 |
| 2017.04.01 දිනට ඉඩම මත ප්‍රත්‍යාගණන සංචිත | | 5 000 |
| 2017.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 6 880 |
| උපචිත පරිපාලන වියදම් | | 250 |
| බැංකු ණය | | 12 000 |
| 2017.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන (2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා) | | 450 |
| කොමිස් ආදායම් | | 3 250 |
| | **159 000** | **159 000** |

[ දෙවැනි පිටුව බලන්න.

**අතිරේක තොරතුරු:**

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත සඳහන් ගැළපීම් කළ යුතු වේ.

(i) තොගය වර්ග තුනකින් සමන්විත වන අතර 2018.03.31 දිනට ඒවායේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පහත පරිදි විය.

| වර්ගය | පිරිවැය (රු.'000) | ශුද්ධ උපලබ්ධි අගය (රු.'000) |
|---|---|---|
| කිරි | 4 200 | 4 400 |
| හාල් | 2 500 | 2 100 |
| සීනි | 3 800 | 3 900 |
| **එකතුව** | **10 500** | **10 400** |

(ii) ප්‍රවර්තන වර්ෂය සඳහා පරිපාලන වියදම් පහත අයිතමවලින් සමන්විත වේ.

| අයිතමය | රු.'000 |
|---|---|
| ගෙවූ වැටුප් ........................................ | 2 700 |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF) | 90 |
| අධ්‍යක්ෂ ගාස්තු ........................................ | 1 500 |
| විගණන ගාස්තු ........................................ | 610 |
| ක්ෂය වියදම් ........................................ | 2 200 |
| **එකතුව** | **7 100** |

More Past Papers at
tamilguru.lk

(iii) පරිපාලන වියදම්හි අඩංගු වැටුප් නිරූපණය කරනුයේ සේවකයන්ට ගෙවූ ශුද්ධ වැටුප ය. ශුද්ධ වැටුප ගණනය කර ඇත්තේ සේවක අර්ථසාධක අරමුදලට කරනු ලබන සේවක දායකය අඩු කිරීමෙන් පසුව ය. සේවක අර්ථසාධක අරමුදලට, සේව්‍ය සහ සේවක දායකයන් පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ. කෙසේ වුව ද සේවක අර්ථසාධක අරමුදලට, ප්‍රවර්තන වර්ෂය සඳහා සේව්‍ය සහ සේවක දායකත්වයන් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවා නොමැති අතර එය ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(iv) 2018.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සමුච්චිත ක්ෂයවල සංයුතිය පහත පරිදි විය.

| විස්තරය | පිරිවැය මත වාර්ෂික ක්ෂය අනුපාතය | පිරිවැය/ ප්‍රත්‍යාගණිත අගය (රු.'000) | සමුච්චිත ක්ෂය (රු.'000) | ධාරණ වටිනාකම (රු.'000) |
|---|---|---|---|---|
| ඉඩම | – | 25 500 | – | 25 500 |
| ගොඩනැගිලි | 5% | 28 000 | 8 000 | 20 000 |
| මෝටර් රථ | 20% | 16 500 | 4 500 | 12 000 |
| කාර්යාල උපකරණ | 10% | 10 000 | 2 000 | 8 000 |
| **එකතුව** | | **80 000** | **14 500** | **65 500** |

(v) භාණ්ඩ බෙදාහැරීම සඳහා මෝටර් රථ භාවිත කරන අතර අනෙකුත් සියළුම දේපළ, පිරියත සහ උපකරණ අයිතම පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ. ක්ෂය කළ හැකි සියළු වත්කම්, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කෙරේ. ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය වෙන් කර ඇත.

(vi) ව්‍යාපාරයේ ඉඩම 2015.03.31 දින ප්‍රථම වරට රු. 25 500 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2018.03.31 දින රු. 19 500 000 කට ඉඩම දෙවන වරට ප්‍රත්‍යාගණනය කර ඇති අතර එය මෙතෙක් ගිණුම්ගත කර නොමැත.

(vii) රු. 4 000 000 ක් පිරිවැය වූ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම 2018.03.31 දින අවසන් කරන ලද අතර නව ගොඩනැගිල්ලට අදාළ ගැළපුම් නිසි පරිදි ගිණුම්ගත කර ඇත.

(viii) පිරිවැය රු. 2 500 000 ක් වූ මෝටර් රථයක් 2018.03.31 දින රු. 1 500 000 කට විකුණන ලදී. මෙම මෝටර් රථය, 2016.10.01 දින මිල දී ගන්නා ලදී. මෙම විකිණීම නිසි පරිදි ගිණුම්ගත කර ඇති අතර මෝටර් රථය විකිණීමෙන් ලද අලාභය, බෙදාහැරීමේ පිරිවැය යටතේ සටහන් කර ඇත.

(ix) වර්ෂය තුළදී වෙනත් කිසිදු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් හෝ ඉවත් කිරීම් හෝ නොවී ය.

(x) වසරක වගකීම් සහතික කාලයක් සහිතව සමාගම භාණ්ඩ විකුණනු ලබයි. පසුගිය වර්ෂය තුළ කරන ලද විකුණුම් සඳහා ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගම විසින් වගකීම් සහතික වියදම් ලෙස රු. 450 000 ක් ගෙවා ඇත. මෙය ප්‍රවර්තන වර්ෂයේ බෙදාහැරීමේ පිරිවැය යටතේ ඇතුළත් කර ඇත. 2018.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන ලෙස රු. 750 000 ක් ඇස්තමේන්තු කර ඇත.

[තුන්වැනි පිටුව බලන්න.

(xi) බැංකු ණය 2018.03.31 දින ලබාගත් අතර එය 2019.03.31 දිනෙන් ආරම්භ වී රු. 3 580 000 බැගින් වූ වාර්ෂික වාරික 5 කින් ගෙවනු ලැබේ. වාර්ෂික ණය පොලී අනුපාතය 15% ක් වේ.

(xii) පෙර වර්ෂය සඳහා ගෙවූ රු. 350 000 ක් සහ ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා කළ ගෙවීම්, ගෙවූ ආදායම් බදු තුළ අන්තර්ගත වේ. ප්‍රවර්තන වර්ෂයේ අවසාන කාර්තුව සඳහා ආදායම් බදු වගකීම රු. 400 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය මූල්‍ය ප්‍රකාශනවල ගැළපිය යුතු වේ.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත හිරුක පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2018.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(මුළු ලකුණු 20 යි)**

2. (අ) අමල්, බිමල් සහ චමල් හවුල් ව්‍යාපාරය නිෂ්පාදන ව්‍යාපාරයක නිරත වේ. 2017.03.31 දිනට එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| **තොගය:** | |
| අමුද්‍රව්‍ය ................................ | 600 |
| නොනිමි (නිෂ්පාදන පිරිවැයට අගය කළ)....... | 800 |
| නිමි භාණ්ඩ ................................ | 1 200 |
| **ප්‍රාග්ධන ගිණුම්:** | |
| අමල් ................................ | 10 000 |
| බිමල් ................................ | 6 000 |
| චමල් ................................ | 4 000 |
| **ජංගම ගිණුම්:** | |
| අමල් ................................ | 1 200 |
| බිමල් ................................ | 1 000 |
| චමල් ................................ | 600 |
| ණය ගිණුම - අමල් ................................ | 4 000 |

**අතිරේක තොරතුරු:**

(i) හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි කොන්දේසි පහත පරිදි වේ:

- අමල්, බිමල් සහ චමල් පිළිවෙළින් 5:3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනී.
- ප්‍රාග්ධන ගිණුම්වල ආරම්භක ශේෂ මත 10% ක වාර්ෂික පොලියක් හවුල්කරුවන්ට හිමි වේ.
- හවුල්කරුවන් විසින් සපයන ණය සඳහා 12% ක වාර්ෂික පොලියක් හිමි වේ.

(ii) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් ................................ | 1 400 |
| ඍජු වේතන ................................ | 700 |
| පරිපාලන සහ බෙදාහැරීමේ වියදම්................ | 2 350 |
| මූල්‍ය වියදම්................................ | 350 |
| විකුණුම් ................................ | 9 700 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ................ | 300 |

(iii) 2018.03.31 දිනට තොග:

| | රු.'000 |
|---|---|
| අමුද්‍රව්‍ය ................................ | 1 000 |
| නොනිමි (නිෂ්පාදන පිරිවැයට අගය කළ) ..... | 600 |
| නිමි භාණ්ඩ ................................ | 1 500 |

[හතරවැනි පිටුව බලන්න.

(iv) අමල්ගේ ණය සඳහා පොලිය ගෙවා නොමැති අතර ඒ සඳහා කිසිදු සටහනක් පොත්වල තබා නොමැත.

(v) කර්මාන්තශාලාවෙහි කළමනාකරු ලෙස සේවය කිරීම වෙනුවෙන් චමල්ට රු. 10 000 ක මාසික වේතනයක් ගෙවනු ලැබේ. චමල්ට මාස 10 ක් සඳහා ගෙවන ලද වැටුප, නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය තුළ ඇතුළත් කර ඇත. ඉතිරි කාලච්ඡේදය සඳහා වැටුප් ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(vi) ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය රු. 1 400 000 ක් වන අතර එය පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් යටතේ ගිණුම්ගත කර ඇත. මෙම වටිනාකම කර්මාන්තශාලාව සහ පරිපාලන කාර්යාලය අතර සමානව බෙදාහැරිය යුතු වේ.

(vii) අසනීප තත්ත්වයක් නිසා 2018.03.31 දින සිට බිමල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. එදිනට ඔහුගේ කීර්තිනාම කොටස රු. 2 100 000 ක් ලෙස ඇස්තමේන්තු කර ගිණුම්ගත කර ඇත. ඔහුට ගෙවිය යුතු මුදලින් රු. 3 000 000 ක් වෛද්‍ය ප්‍රතිකාර සඳහා විශ්‍රාම යාමේදී ගෙවූ අතර ඉතිරි මුදල ණය ගිණුමකට මාරු කරන ලදී. අමල් සහ චමල් පිළිවෙළින් 5:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ විය.

**අවශ්‍යවන්නේ:**

(1) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අමල්, බිමල් සහ චමල් හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන් ද සහිතව)

(2) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්

(3) බිමල්ගේ ණය ගිණුම

**(ලකුණු 10 යි)**

(ආ) පලතුරු බීම සැකසුම් සමාගමක් වර්ග දෙකක පලතුරු බීම (අඹ සහ අන්නාසි) නිෂ්පාදනය කරනු ලබයි. **සැකසුම්** සහ **බෝතල් කිරීම්** යන නිෂ්පාදන අංශ දෙකකින් සමන්විත කර්මාන්තශාලාවක් සහ සේවා අංශයක් වන **ගබඩාවක්** මෙම සමාගම සතු වේ. කර්මාන්තශාලාව සහ ගබඩාව වෙන් වෙන් ගොඩනැගිලිවල පිහිටා ඇත.

වසරක කාලයක් සඳහා ඒකක 50 000 ක ක්‍රියාකාරී මට්ටමේදී අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

| **විස්තරය** | **කර්මාන්තශාලාව** (රු.) | **ගබඩාව** (රු.) | **එකතුව** (රු.) |
|---|---|---|---|
| කුලී | 180 000 | 50 000 | 230 000 |
| වක්‍ර වේතන | ? | ? | 400 000 |
| විදුලි වියදම් | 120 000 | 30 000 | 150 000 |
| යන්ත්‍ර රක්ෂණ | 90 000 | 20 000 | 110 000 |
| ගොඩනැගිලි සඳහා වරිපණම් | 90 000 | 30 000 | 120 000 |
| ආරක්ෂක සේවා සඳහා ගාස්තු | ? | ? | 360 000 |

| **විස්තරය** | **සැකසුම්** | **බෝතල් කිරීම්** | **ගබඩාව** |
|---|---|---|---|
| වක්‍ර සේවක සංඛ්‍යාව | 10 | 15 | 15 |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර්) | 12 000 | 18 000 | 8 000 |
| නිෂ්පාදන යන්ත්‍ර පිරිවැය (රු.) | 400 000 | 200 000 | – |
| සිසිල්කරණ යන්ත්‍රයේ පිරිවැය (රු.) | – | – | 250 000 |
| කාලච්ඡේදය සඳහා යන්ත්‍ර පැය | 100 000 | 65 000 | – |
| ආරක්ෂක සේවක සංඛ්‍යාව | 2 | 2 | 8 |
| කාලච්ඡේදය සඳහා මුළු කිලෝවොට් පැය | 3 000 | 2 000 | 1 000 |

**අතිරේක තොරතුරු:**

(i) නිෂ්පාදන යන්ත්‍ර සහ සිසිල්කරණ යන්ත්‍රය වාර්ෂිකව පිළිවෙළින් 10% සහ 8% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(ii) ගබඩාවෙහි මුළු පොදුකාර්ය පිරිවැය, නිෂ්පාදන යන්ත්‍රවල පිරිවැය මත **සැකසුම්** සහ **බෝතල් කිරීමේ** අංශ අතර නැවත විභජනය කරනු ලැබේ.

(iii) නිෂ්පාදන අංශවල පොදුකාර්ය පිරිවැය, යන්ත්‍ර පැය මත අන්තර්ග්‍රහණය කෙරේ.

/පස්වැනි පිටුව බලන්න.

(iv) පහත තොරතුරු අඹ බීම බෝතලයකට අදාළ වේ.

| විස්තරය | | එක් බෝතලයක් සඳහා |
|---|---|---|
| ගත කළ සත්‍ය කාලය: | සැකසුම් අංශය | මිනිත්තු 12 |
| | බෝතල් කිරීමේ අංශය | මිනිත්තු 6 |
| ඍජු පිරිවැය: | අමුද්‍රව්‍ය | රු. 6.40 |
| | ශ්‍රමය | රු. 5.00 |
| නිෂ්පාදන නොවන විචල්‍ය පොදුකාර්ය පිරිවැය | | රු. 4.00 |

(v) නිෂ්පාදන නොවන ස්ථාවර පොදුකාර්ය පිරිවැය රු. 300 000 කි.

(vi) එක් එක් භාණ්ඩයෙහි විකුණුම් මිල මත ලාභ ආන්තිකය 20% කි.

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (සේවා අංශයේ පොදුකාර්ය පිරිවැය නැවත විභජනය ද ඇතුළුව)

(2) සැකසුම් සහ බෝතල් කිරීමේ අංශ දෙක සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) අඹ බීම බෝතලයක නිෂ්පාදන පිරිවැය

(4) අඹ බීම බෝතලයක අයවැයගත විකුණුම් මිල

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 20 යි)**

3. 2018.01.01 දින සමන් විසින් ලිපිද්‍රව්‍ය අලෙවි කරන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ව්‍යාපාරයෙහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලබයි. ව්‍යාපාරයේ කළමනාකරු ලෙස සමන් සේවය කරන අතර විකුණුම් සහ තොග පවත්වාගෙන යාම සඳහා සහාය වීමට සේවකයකු බඳවා ගන්නා ලදී.

2018 ජනවාරි මාසයේදී පහත ගනුදෙනු ව්‍යාපාරය තුළ සිදු විය.

| අංකය | දිනය | චෙක්පත් අංකය | ගනුදෙනුව |
|---|---|---|---|
| 1 | 01/01 | | සමන් මුදලින් රු. 600 000 ක් ආයෝජනය කරන ලද අතර රු. 180 000 ක් වටිනා ලී බඩු ගෙන එන ලදී. |
| 2 | 01/03 | 5001 | රු. 300 000 ක ලිපිද්‍රව්‍ය අත්පිට මුදලට මිල දී ගන්නා ලදී. |
| 3 | 01/07 | 4450 | රු. 100 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 150 000 කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 4 | 01/10 | | රු. 150 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 200 000 කට ගාමිණීට ණයට විකුණන ලදී. |
| 5 | 01/12 | | රු. 400 000 ක ලිපිද්‍රව්‍ය සීමිත ජයමාල් පොදු සමාගමෙන් ණයට මිල දී ගන්නා ලදී. |
| 6 | 01/12 | | රු. 300 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 280 000 කට නිමල්ට ණයට විකුණන ලදී. |
| 7 | 01/15 | 6005 | ගාමිණීගෙන් ලැබිය යුතු මුළු මුදල ලැබුණි. |
| 8 | 01/18 | 2005 | රු. 150 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 120 000 කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 9 | 01/25 | <br>5002<br>5003 | වැටුප් ගෙවීම්:<br>සමන් රු. 50 000<br>සහායක රු. 25 000 |
| 10 | 01/26 | 5004 | මාසය සඳහා කාර්යාල වියදම් රු. 40 000 ක් දරන ලද අතර එයින් රු. 30 000 ක් ගෙවන ලදී. |
| 11 | 01/29 | 3010 | රු. 10 000 ක වට්ටමක් ලබා දීමෙන් පසු නිමල්ගෙන් ලැබිය යුතු මුළු මුදල ලැබුණි. |
| 12 | 01/30 | 5005 | සීමිත ජයමාල් පොදු සමාගමට ගෙවිය යුතු මුදල පියවන ලදී. |

More Past Papers at
tamilguru.lk

2018.02.03 දින ලද, ජනවාරි මාසය සඳහා ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

| සමන් වෙළෙන්දෝ<br>ගිණුම් අංකය: 5063-7000-8002 | | | | |
|---|---|---|---|---|
| **දිනය** | **විස්තරය** | **හර (රු.)** | **බැර (රු.)** | **ශේෂය (රු.)** |
| 01/01 | මුදල් තැන්පතු | | 600 000 | 600 000 |
| 01/03 | චෙක්පත් අංක 5001 | 300 000 | | 300 000 |
| 01/07 | චෙක්පත් අංක 4450 | | 150 000 | 450 000 |
| 01/15 | චෙක්පත් අංක 6005 | | 200 000 | 650 000 |
| 01/18 | චෙක්පත් අංක 2005 | | 120 000 | 770 000 |
| 01/25 | චෙක්පත් අංක 5002 | 50 000 | | |
| | චෙක්පත් අංක 5003 | 25 000 | | 695 000 |
| 01/26 | චෙක්පත් අංක 5004 | 30 000 | | |
| | බැංකු ගාස්තු | 5 000 | | 660 000 |
| 01/31 | ශේෂය | | | 660 000 |

**අවශ්‍යවන්නේ:**

(1) අංක 1 සිට 12 දක්වා ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (–) ද යන්න සඳහන් කරන්න. (පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

**(රු.'000)**

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | මුදල් | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයුම් |
| | | | | | | | | |
| | | | | | | | | |

(2) 2018.01.31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් ලැබීම් ජර්නලය

(3) 2018 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය (බැංකු ප්‍රකාශනයෙහි ශේෂයෙන් ආරම්භ කරන්න.)

**(මුළු ලකුණු 15 යි)**

4. සීමිත මිතුන් පුද්ගලික සමාගම පොත්සලක් පවත්වාගෙන යනු ලැබේ. 2018 මාර්තු මාසය සඳහා එහි ගනුදෙනු පහත පරිදි වේ.

| | වටිනාකම (රු.) |
|---|---|
| **නාදන් ප්‍රකාශකයන් සමග ගනුදෙනු:** | |
| පොත් ණයට ගැනුම් (ඉන්වොයිස් අංක 15670) | 550 000 |
| පිරිවිතර හා නොගැළපුන පොත් ආපසු යැවුම් | 50 000 |
| 5% ක මුදල් වට්ටමකට යටත්ව මුදල් ගෙවීම් | 475 000 |
| අත්පිට මුදලට පොත් මිලට ගැනුම් | 100 000 |
| **සමනල ප්‍රකාශකයන් සමග ගනුදෙනු:** | |
| පොත් ණයට ගැනුම් (ඉන්වොයිස් අංක 13209) - ලැයිස්තුගත මිල | 410 000 |
| අඩුකළ වෙළෙඳ වට්ටම | 10 000 |
| මුදල් ගෙවීම් | 300 000 |
| අත්පිට මුදලට පොත් මිලට ගැනුම් | 150 000 |
| **විකුණුම් (විකුණුම් මිල මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව):** | |
| මුදලට | 800 000 |
| ණයට | 500 000 |
| ණයගැතියන්ගෙන් මුදල් ලැබීම් | 420 000 |

[හත්වැනි පිටුව බලන්න.

**සේවකයන්ට වැටුප් ගෙවීම්:**

කළමනාකරු - ජිනදාස ........................................ 63 000

ගබඩා පාලක - සිරිපාල ........................................ 45 000

විකුණුම් සහායක - සුගත් ........................................ 27 000

කුලී ගෙවීම් ........................................ 72 000

**අතිරේක තොරතුරු:**

(i) 2018 මාර්තු මාසය සඳහා සියලු සේවකයන්ට වැටුප් ගෙවා ඇත්තේ පහත දැ අඩු කිරීමෙන් පසුව ය.
  සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකය    දළ වැටුපෙන් 8% යි.
  සේවක සුභසාධක අරමුදලට මාසික දායකය    දළ වැටුපෙන් 2% යි.

(ii) සමාගම, සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට (ETF) පිළිවෙළින් දළ වැටුපෙන් 12% ක් සහ 3% ක් ලෙස දායක වේ.

(iii) සෑම මාසයකම EPF, ETF සහ සුභසාධක අරමුදල් සඳහා ඊට පසුව එළැඹෙන මාසයේ 10 වන දින සමාගම මුදල් ප්‍රේෂණය කරනු ලබයි.

(iv) 2018.03.01 දිනට වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම්:

| **අයිතමය** | **රු.** |
|---|---|
| පොත් තොගය | 150 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දැ | 120 000 |
| වෙළෙඳ ලැබිය යුතු දැ | 180 000 |
| ගෙවිය යුතු EPF | 30 000 |
| ගෙවිය යුතු ETF | 4 500 |
| සේවක සුභසාධක අරමුදලට ගෙවිය යුතු මුදල | 3 000 |
| මුදල් | 50 000 |

(v) කුලියට ගත් ගොඩනැගිල්ලක පොත්හල පවත්වාගෙන යන අතර ගෙවන ලද කුලිය 2018.03.01 දින සිට ඉදිරි මාස හයක කාලයකට අදාළ වේ.

**අවශ්‍යවන්නේ:**

(1) පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරමින් 2018 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය:

| **සේවකයාගේ නම** | **දළ වැටුප (රු.)** | **අඩු කිරීම් (රු.)** | | **මුළු අඩු කිරීම් (රු.)** | **ශුද්ධ වැටුප (රු.)** | **සේව්‍ය දායකත්වය (රු.)** | |
|---|---|---|---|---|---|---|---|
| | | **EPF** | **සේවක සුභසාධක අරමුදල** | | | **EPF** | **ETF** |
| | | | | | | | |
| | | | | | | | |

(2) 2018.03.31 දිනෙන් අවසන් මාසය සඳහා සේවකයන්ට අදාළ මුළු වියදම (එක් එක් වියදම් අයිතමය වෙන වෙනම දක්වන්න.)

(3) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගැනුම් ජර්නලය සහ මුදල් ගෙවීම් ජර්නලය

(4) 2018.03.31 දිනට පහත වත්කම් සහ වගකීම්:
  (i) පොත් තොගය
  (ii) වෙළෙඳ ලැබිය යුතු දැ
  (iii) වෙළෙඳ ගෙවිය යුතු දැ
  (iv) වෙනත් ගෙවිය යුතු දැ
  (v) ඉදිරියට ගෙවූ වියදම්

**(මුළු ලකුණු 15 යි)**

5. (අ) සමාගමක් පිරිවැය රු. 4 000 000 ක් වූ නව යන්ත්‍රයක් මිල දී ගැනීමට තීරණය කර ඇති අතර එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 4 ක් වේ. 10% ක වට්ටම් සාධකය යටතේ මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය රු. 600 000 ක් **ධන** ලෙස ගණනය කර ඇත. කෙසේ වුව ද මෙම ගණනය කිරීමේදී පහත මුදල් ප්‍රවාහ අයිතම සැලකිල්ලට ගෙන නොමැති බව සමාගමේ ගණකාධිකාරීවරයා විසින් පසුව සොයාගන්නා ලදී.

| අයිතම අංක | විස්තරය | වටිනාකම (රු.'000) |
|---|---|---|
| 1 | වාර්ෂික මෙහෙයුම් වියදම් ඉතිරිය | 300 |
| 2 | පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල | 200 |
| 3 | ව්‍යාපෘති කාලය අවසානයේදී නව යන්ත්‍රයේ විකුණුම් මිල | 500 |
| 4 | නව යන්ත්‍රයේ සවිකිරීම් ගාස්තු | 1 200 |
| 5 | මධ්‍යම පරිසර අධිකාරියට ගෙවිය යුතු වාර්ෂික දායක මුදල (පළමු වසර අවසානයේ සිට ගෙවිය යුතු වේ.) | 200 |

10% වට්ටම් සාධක:

| වසර | 0 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|
| 10% වට්ටම් සාධකය | 1 | 0.91 | 0.83 | 0.75 | 0.68 |

**අවශ්‍යවන්නේ:**

(1) ඉහත අංක 1 - 5 දක්වා ඇති අයිතමවලට අදාළ වාර්ෂික මුදල් ගලා ඒම් (+) ලෙස සහ ගලා යාම් (–) ලෙස අගයන් සහිතව දක්වන්න. (පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

(රු.'000)

| අයිතම අංකය | වසර | | | | |
|---|---|---|---|---|---|
| | 0 | 1 | 2 | 3 | 4 |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

(2) 10% වට්ටම් සාධකයේදී ව්‍යාපෘතියේ සංශෝධිත ශුද්ධ වර්තමාන අගය සහ නිර්දේශය

(ලකුණු 05 යි)

(ආ) පාසලක ආදි ශිෂ්‍ය සංගමයක, 2017.01.01 දිනට සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දැක්වේ:

| විස්තරය | රු.'000 |
|---|---|
| **වත්කම්:** | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 4 500 |
| ලිපිද්‍රව්‍ය තොගය | 80 |
| 10% ස්ථාවර තැන්පතුව | 1 400 |
| මුදල් | 20 |
| | **6 000** |
| **හිමිකම් සහ වගකීම්:** | |
| සමුච්චිත අරමුදල | 4 580 |
| ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුදල | 1 400 |
| උපචිත විදුලි වියදම් | 20 |
| | **6 000** |

**අතිරේක තොරතුරු:**

(i) 2017 වසර තුළදී සාමාජිකත්වය ලබාගත් අය ද ඇතුළුව 2017.12.31 දිනට සංගමයේ සාමාජිකයන් ගණන 800 ක් විය.

(ii) ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුදල සඳහා ලද මුදල් යොදා ගනිමින් 2016.12.31 දින මාස හයක කාලයක් සඳහා ස්ථාවර තැන්පතුව ආරම්භ කරන ලදී.

(iii) වසර තුළ මුදල් ලැබීම්:
- රු. 1 000 බැගින් නව සාමාජිකයින් 50 දෙනෙකුගේ ඇතුළත් වීමේ ගාස්තු (සියලු ම නව සාමාජිකයින් 2017.01.01 දින සංගමයට බැඳුනි.)
- සාමාජිකයකුගෙන් රු. 2 000 බැගින් සාමාජිකයන් 640 කගෙන් වාර්ෂික සාමාජික මුදල් ලැබී ඇත.
- 2017.07.01 දින ස්ථාවර තැන්පතුව කල්පිරුණු අතර පොලී ආදායම ද සහිතව මුදල් ලැබුණි.

[නවවැනි පිටුව බලන්න.

(iv) වසර තුළ ගෙවීම්:
- 2016 දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු රු. 20 000 ද ඇතුළුව රු. 120 000 ක විදුලි ගාස්තු ගෙවීම
- වාර්ෂික මහා සභා රැස්වීම සඳහා සංග්‍රහ වියදම් රු. 170 000
- ලිපිද්‍රව්‍ය මිල දී ගැනුම් රු. 200 000 (2017.12.31 දිනට ලිපිද්‍රව්‍ය තොගය රු. 40 000 ක් විය.)
- නඩත්තු වියදම් රු. 160 000
- ස්ථාවර තැන්පතුව කල්පිරීමෙන් ලද මුදලින් රු. 1 000 000 ක් භාවිත කරමින් සංගමයේ ගොඩනැගිල්ල ඉදිකර අවසාන කිරීම

(v) සංගමයේ වාර්ෂික සුහද හමුව 2017.12.31 දින නව ගොඩනැගිල්ලෙහි පවත්වන ලදී. ඒ සඳහා රු. 550 000 ක වියදමක් දරන ලද අතර එය 2018.01.10 වන දින ගෙවන ලදී.

(vi) දේපළ, පිරියත සහ උපකරණ වාර්ෂික ක්ෂය රු. 450 000 ක් විය.

**අවශ්‍යවන්නේ:**

ආදි ශිෂ්‍ය සංගමය සඳහා:

(1) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම

(2) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(3) 2017.12.31 දිනට හිමිකම (පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

| **විස්තරය** | **හිමිකම් අයිතම (රු.'000)** | |
|---|---|---|
| | **සමුච්චිත අරමුදල** | **ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුදල** |
| 2017.01.01 දිනට ශේෂය | ............................ | ............................ |
| **එකතු කිරීම්:** | | |
| ................ | ............................ | ............................ |
| ................ | ............................ | ............................ |
| **අඩු කිරීම්:** | | |
| .................... | ............................ | ............................ |
| .................... | ............................ | ............................ |
| 2017.12.31 දිනට ශේෂය | ............................ | ............................ |

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 15 යි)**

6. 2018.03.31 දිනට සහ 2017.03.31 දිනට සීමිත බෝවත්ත පොදු සමාගමේ සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දී ඇත.

| **විස්තරය** | **2018.03.31 දිනට (රු.'000)** | **2017.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ-ධාරණ වටිනාකම | 28 000 | 19 000 |
| තොග | 9 680 | 8 800 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 9 500 | 10 500 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 5 020 | 2 200 |
| **මුළු වත්කම්** | **52 200** | **40 500** |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය-සාමාන්‍ය කොටස් | 22 800 | 18 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 2 000 | – |
| රඳවාගත් ඉපැයුම් | 5 200 | 2 500 |
| දිගුකාලීන ණය | 10 500 | 10 100 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 8 600 | 8 100 |
| ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | 500 | 400 |
| බැංකු අයිරාව | 2 600 | 1 400 |
| **මුළු හිමිකම සහ වගකීම්** | **52 200** | **40 500** |

**අතිරේක තොරතුරු:**

(i) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර සහ බදු පසු ලාභ පිළිවෙළින් රු. 6 000 000 ක් සහ රු. 4 500 000 ක් විය.

(ii) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දිගුකාලීන ණය මත මුළු පොලී වියදම රු. 600 000 ක් විය. මෙහි උපචිත පොලිය රු. 400 000 ක් වන අතර එය වැරදීමකින් 2018.03.31 දිනට දිගුකාලීන ණය ශේෂයට එකතු කර ඇත.

(iii) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වියදම රු. 1 250 000 ක් විය. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී නව මෝටර් රථයක් අත්පිට මුදලට මිල දී ගත් අතර ඉඩම් ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් අතිරික්තයක් ඇති විය. වර්ෂය තුළදී වෙනත් කිසිදු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීමක් හෝ ඉවත් කිරීමක් හෝ නොමැත.

(iv) වර්ෂය තුළදී සමාගම විසින් ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් කරන ලද අතර 2018.01.01 දින සාමාන්‍ය කොටස්කරුවන්ට අතුරු ලාභාංශයක් ගෙවන ලදී.

(v) දිගුකාලීන ණය, 2020.03.31 දින සිට ගෙවිය යුතු වේ.

**අවශ්‍යවන්නේ:**

(1) LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ ගණනය කිරීමට වක්‍ර ක්‍රමය භාවිත කරන්න.)

**(ලකුණු 10 යි)**

(2) ප්‍රවර්තන වර්ෂය සඳහා පහත අනුපාත:
- (i) ජංගම අනුපාතය
- (ii) ක්ෂණික වත්කම් අනුපාතය
- (iii) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය
- (iv) ණය-හිමිකම් අනුපාතය
- (v) පොලී ආවරණ අනුපාතය

**(ලකුණු 05 යි)**

**(මුළු ලකුණු 15 යි)**

7. (අ) තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන සමාගමක වාර්ෂික මෙහෙයුම් ධාරිතාව ඒකක 1 500 කි. 2019 වර්ෂය සඳහා මෙම භාණ්ඩයේ අයවැයගත තොරතුරු පහත දී ඇත.

වාර්ෂික නිෂ්පාදනය සහ විකුණුම් ................................ ඒකක 1 200

**ඒකකයක් සඳහා රු.:**

| | |
|---|---|
| විකුණුම් මිල ................................ | 1 200 |
| සෘජු අමුද්‍රව්‍ය ................................ | 160 |
| සෘජු ශ්‍රමය (ඒකක මත පදනම්ව ගෙවූ) ................................ | 180 |
| විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ................................ | 100 |
| විචල්‍ය නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය ................ | 200 |

වාර්ෂික ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ...................... රු. 132 000

වාර්ෂික ස්ථාවර නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය ........ රු. 180 000

**අවශ්‍යවන්නේ:**

(1) ඒකකයක විචල්‍ය පිරිවැය

(2) ඒකකයක නිෂ්පාදන පිරිවැය

(3) ඒකකයක ලාභය

(4) ක්‍රියාකාරී මට්ටම ඒකක 1 500 දී මුළු පිරිවැය

**(ලකුණු 05 යි)**

More Past Papers at
tamilguru.lk

(ආ) මහනුවර පිහිටි අධ්‍යාපන ආයතනයක් ගිණුම්කරණ ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දීමට සැලසුම් කරමින් සිටී. එය කුලියට ගත් ස්ථානයක සති අන්තවල පවත්වනු ලබයි. මෙම පාඨමාලාව විෂයන් 10 කින් සමන්විත වන අතර සෑම විෂයක්ම පැය 15 බැගින් උගන්වනු ලබයි. මෙම පාඨමාලාවෙහි කාලය මාස 6 කි. තව ද පාඨමාලාව අවසානයේදී සෑම සිසුවකු විසින්ම ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

මෙම පාඨමාලාවේ අයවැයගත ආදායම් සහ වියදම් පහත දී ඇත.

**ආදායම්:**

පාඨමාලා ගාස්තු ............ ශිෂ්‍යයකුට රු. 60 000

විභාග ගාස්තු ............ ශිෂ්‍යයකුට රු. 5 000

**වියදම්:**

කථිකාචාර්යවරුන්ට ගෙවීම්:

-දේශන ගාස්තු ............ පැයකට රු. 2 000

-පැවරුම් ලකුණු කිරීමේ ගාස්තු ............ එක් ශිෂ්‍යයකුට එක් විෂයක් සඳහා රු. 600

-ව්‍යාපෘති වාර්තා ඇගයීමේ ගාස්තු ............ එක් වාර්තාවකට රු. 10 000

අධ්‍යයන ද්‍රව්‍ය පිරිවැය ............ එක් ශිෂ්‍යයකුට එක් විෂයයක් සඳහා රු. 500

පාඨමාලා කළමනාකරුගේ වැටුප ............ මසකට රු. 45 000

ගොඩනැගිලි කුලී ............ මසකට රු. 40 000

මෙහෙයුම් වියදම් ............ මාස 6 ක කාලසීමාවකට රු. 70 000

විභාග වියදම් ............ එක් ශිෂ්‍යයකුට එක් විෂයක් සඳහා රු. 400

**අවශ්‍යවන්නේ:**

(1) ශිෂ්‍යයකුගේ දායකය

(2) පාඨමාලාවේ මුළු ස්ථාවර පිරිවැය

(3) පාඨමාලාවේ මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා බඳවාගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව

(4) රු. 200 000 ක ලාභයක් ඉපැයීමට පාඨමාලාවට බඳවා ගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව

(5) අපේක්ෂිත ලාභය සහ බඳවා ගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙළින් රු. 350 000 ක් සහ 30 ක් නම්, එක් ශිෂ්‍යයකුගෙන් අය කළ යුතු අවම පාඨමාලා ගාස්තුව

**(ලකුණු 10 යි)**
**(මුළු ලකුණු 15 යි)**

* * *